ලංකාවට Online

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

(නව විෂය නිර්දේශය)

ii පත්‍රය

ඒකකය - 05

## සංස්කෘතිකාවබෝධය, මාධ්‍යයේ ස්වභාවය හා එහි බලපෑම

නව ප්‍රශ්න සැකසුම - **සංජීව ක්‍රිෂාන්ත රණසිංහ**

කාලය පැය තුනයි.

---

**01)**

(i) **සංස්කෘතිය** යන්න කෙටියෙන් හඳුන්වන්න.

(ii) සංස්කෘතියක් විද්‍යාමාන වන අංග හතරක් **ටයිලර්ගේ නිර්වචනය** ඇසුරින් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න.

(iii) රෝම ජාතිකයින් සංස්කෘතිය යන වචනය **අර්ථ ගැන්වූ ආකාරය** දක්වා එය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(iv) සංස්කෘතික ප්‍රභේද **හතරක්** දක්වා ඒවා උදාහරණ ගනිමින් පැහැදිලි කරන්න.

**02)**

(i) **සැමුවෙල් පුෆෙන්ඩෝර්ෆ්** සංස්කෘතිය පිළිබඳ දක්වන අදහස් දෙක මොනවාද?

(ii) **මාර්කස් ටුලිස් සීසර්** දක්වන සංස්කෘතිය පිළිබඳ අදහස් තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) නූතන යුගයේ සංස්කෘතිය වර්ධනය වන **ප්‍රවණතා දෙක** මොනවාද?

(iv) ජනප්‍රිය සංස්කෘතිය එහි **අංග හතරක්** ඇසුරින් දක්වන්න. ඒ සඳහා **විද්‍යුත් ජනමාධ්‍ය** හා **නව මාධ්‍යයේ** බලපෑම තහවුරු කරන්න.

**03)**

(i) සංස්කෘතිය යන වචනය **කෘෂිකර්මාන්තික සමාජ** හඳුන්වා දෙන්නට භාවිතා කළේ කවුරුන්ද?

(ii) **"සෑම පුද්ගලයෙකුම මවුකුස තුලදීම තම උරුම සංස්කෘතිය වැලඳ ගනී"** කෙටි විමසුමක් කරන්න.

(iii) **ගෝලීයකරණය** යන්න එහි **ලක්ෂණ තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න.

(iv) ගෝලීයකරණය වර්තමාන **ජනමාධ්‍ය** මත ඇති කරන සාධනීය **බලපෑම** කරුණු හතරක් ඔස්සේ පැහැදිලි කරන්න.

**04)**

(i) **බී.මැලිනෝව්ස්කි** සංස්කෘතිය පිළිබඳ දක්වන නිර්වචනය ලියා දක්වන්න.

(ii) යම් සමාජයක් පවත්වාගෙන යන්නට අවශ්‍ය **මෙවලම් හතරක්** දක්වා ඉන් **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(iii) සංස්කෘතියක උත්තරීතර අංග, පූජනීය අංග, පාරිශුද්ධ අංග යන්න වෙන වෙනම උදාහරණ ගෙන පැහැදිලි කරන්න.

(iv) **"මාධ්‍ය සංස්කෘතිය සාම්ප්‍රදායික සංස්කෘතිය ඉක්මවා ව්‍යාප්ත වේ"** මෙම තත්ත්වය තහවුරු කරමින් **රචනාවක්** ලියන්න. (වචන 150කට නොඅඩු)

Sanjeewa Krishantha Ranasinghe

**05)**

(i) Dynamic Of Mass Communication කෘතියේ දක්වන ආකාරයට සංස්කෘතිය **නිර්වචනය** කරන්න.

(ii) සංස්කෘතිය **ප්‍රකෘතියේ විකෘතියයි.** පැහැදිලි කරන්න.

(iii) අද්‍යතනයේ ජනමාධ්‍ය හා නව මාධ්‍ය **පුද්ගල සාමාජානුයෝජනයට** බලපෑම් කරන අයුරු උදාහරණ එක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(iv) සාම්ප්‍රදායික සංස්කෘතික අංග වර්තමානයේ **අභියෝගයට** ලක්වී ඇති අතර **ආගමික මතවාද** ඉදිරියේ එය එසේ නොවන අවස්ථා තිබේ. **උදාහරණ දෙකක්** ඇසුරින් දක්වන්න.

Sanjeewa Krishantha Ranasinghe

**070 31 98 591 / 077 45 17 280**

**070 31 98 591**

**Sanjeewa Krishantha** **Sanjeewa Krishantha**